**පූජාපිටිය ප්‍රාදේශීය සභාව - 2023**
**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පූජාපිටිය ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට පූජාපිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මුල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතී,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 සිට සමාලෝචිත වර්ෂය දක්වා ගෙවීම් කළ ව්‍යාපාති 06 ක වටිනාකම වූ රු. 1,149,486 ක් හා 2021 හා ඉකුත් වර්ෂය තුළ ගිවිසුමකට හෝ එළඹ නොමැති රු. 1,050,000 ක ව්‍යාපෘති 09 ක් ණය හිමි ලෙස ගිණුම්ගත කිරීමෙන් ණය හිමියෝ රු. 2,199,486 ක් වැඩියෙන් දැක්වුණි. | ඉදිරිවර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ හා ඉකුත් වර්ෂ තුළ නිරවුල් කරන ලද රු. 802,608 ක ණය ගැති ශේෂ 04 ක් තවදුරටත් ණයගැතියන් යටතේ දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | ලී බඩු හා සවිකිරීම් ඒකක 04 ක හා මෝටර් රථයක වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | තක්සේරුවක් ලබා ගෙන ගිණුම්ගත කරන බව. | වත්කම් ගිණුම්ගත කළ යුතුය. |

**1.6.2 අධිකාරී බලය නොලත් ගනුදෙනු**

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විධිමත් අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ජර්නල් සටහන් 59 හා 60 යටතේ රු.4,044,650 ක ණයගැති ශේෂ 39 ක් හා ජර්නල් සටහන් 66 හා 67 යටතේ රු.5,957,616 ක ණයහිමි ශේෂ 109ක් සමුච්චිත අරමුදලට ලියාහැර තිබුණි. | සාකච්ඡා කර තීරණ ගැනීමට කටයුතු කරන බව. | විධිමත් අනුමැතියන් ලබාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.9,123,236 ක වත්කම් විෂයයන් 03 කට අදාළ උපලේඛන හා ශේෂ සනාථ කිරීම් ඉදිරිපත් නොකිරීම නිසා ඒවා සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | ගිණුම් ශේෂයන්ට අදාළ ලේඛන, ලිපිගොනු හා උපලේඛන පවත්වා ගත යුතුය. |

**1.7 අනුකූල නොවීම්**
**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | නිවාස හා නගර සංවර්ධන ආඥා පනතේ 12(1) (ඒ) වගන්තිය | නිකුත් කරනු ලබන නියෝග අනුව සංවර්ධන අවසර පත්‍රයක් ලබා නොගෙන ඉදිකර තිබූ ගොඩනැගිලි 06 ක් සම්බන්ධයෙන් සභාව කිසිදු ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබුණි. | නීතිමය කටයුතු කරන බව | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 | ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | ඉදිරියේදී සමීක්ෂණය සිදු කිරීමට කටයුතු කරන බව. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| **(ආ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | | | |
| | මුදල් රෙගුලාසි 571(3) | 1,904,323 කාලය ඉක්මවා තිබුණු විවිධ තැන්පතු ශේෂ 07 ක් හා රඳවුම් තැන්පතු 07 ක් නිරවුල් කර නොතිබුණි. | ඉදිරියේදී මු.රෙ ප්‍රකාරව කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 28,861,015 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 11,558,476 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම් විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | **ආදායම් ප්‍රභවය** | **ඇස්තමේන්තු ගත ආදායම** | **බිල් කළ ආදායම** | **රැස්කළ ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** | **ඇස්තමේන්තු ගත ආදායම** | **බිල් කළ ආදායම** | **රැස්කළ ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 4,309,000 | 4,436,291 | 5,432,139 | 2,658,450 | 4,306,980 | 4,361,957 | 2,801,917 | 3,654,298 |
| (ii) | කුලී | 6,540,000 | 6,416,060 | 6,056,038 | 651,394 | 5,129,648 | 4,381,873 | 4,083,675 | 291,372 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,575,150 | 2,425,460 | 2,425,460 | - | 2,702,050 | 2,485,635 | 2,485,635 | - |
| (iv) | වෙනත් ආදායම් | 33,249,400 | 39,679,175 | 19,048,816 | 58,447,126 | 25,643,240 | 20,607,650 | 9,194,648 | 37,816,767 |
| | | 46,673,550 | 52,956,986 | 32,962,453 | 61,756,970 | 37,781,918 | 31,837,115 | 18,565,875 | |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

**සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධන සම්බන්ධ නිරීක්ෂණ දැක්වේ**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම් හා බදු** | | |
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟ වරිපනම් බදු ශේෂය රු.2,637,257 ක් වූ අතර, එක ඒකකයක වරිපනම් බදු හිඟය රු.5,000 ඉක්මවූ වරිපනම් ඒකක 54 කින් එකතුව රු.479,366 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ ආදායම් රැස්කිරීමට කටයුතු යොදා ඇති බව. | හිඟ ආදායම් රැස්කළ යුතුය. |
| **(ආ) උසාවි දඩ හා මුද්දර ගාස්තු** | | |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.816,851 ක් හා මුද්දර ගාස්තු රු.56,386,881 ක් විය. | අයකර ගැනීමට කටයුතු කරන බව. | අදාළ මුද්දර ගාස්තු හා උසාවි දඩ ගෙන්වා ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කසළ කළමනාකරණය සඳහා යෝජිත එනසල්මඩ ඉඩම මැනීමේ හා පවරා ගැනීමේ ගාස්තු ලෙස රු.400,000 ක් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩලය වෙත 2013 වර්ෂයේදී ගෙවා තිබුණද විගණිත දින වන විටත් ඉඩම පවරාගෙන කසළ කළමනාකරණ කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණි. | වැය කළ මුදල් නැවත ලබා ගන්නා බව | කසළ කළමනාකරණය ක්‍රියාත්මක කළ යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2008 වර්ෂයේ සිට පැවත එන දායක විශ්‍රාම වැටුප් අරමුදලට රු. 3,221,904 ක ශේෂයක් ගෙවීමට කටයුතු කර නොතිබුණි. | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් විමසීම් කළ බව. | නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | අඹතැන්න කිංග්ස්කෝට් නැමති ඉඩම 1994 සිට 2004 වර්ෂ තුළ අදියර III ක් යටතේ පෞද්ගලික සමාගමක් විසින් අනුබෙදුම් කර වෙන්දේසියේ විකුණා තිබුණු අඹතැන්න කිංග්ස් කෝට් නමැති ඉඩමෙන් ප්‍රජා හා විනෝද කටයුතු සඳහා පර්චස් 156 ක ඉඩම් කොටසක් සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන දිනට සභාව පවරාගෙන තිබුණු පර්චස් 23 ක කොටසද කිසිදු පොදු කටයුත්තකට භාවිතා නොකර ආරක්ෂිත වැටවල් නොයොදවා නිෂ්කාර්යව පැවතුණි. | ඉඩම් කොටස් පවරා ගැනීමට කටයුතු කර නොමැති බව හා පවරා ගත් ඉඩම් ඵලදායී කාර්යයකට යෙදවීමට කටයුතු කරන බව. | පවරා නොගත් ඉඩම් පවරා ගත යුතු අතර එම ඉඩම් අරමුණුගත කාර්යයන්ට යොදවාගත යුතුය. |
| (ඇ) | 2016 පෙබරවාරි 23 දිනැති අංක 1955/7 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් පළකල ප්‍රාදේශීය සභා සීමාව තුළ ගොඩනැගිලි ඉදි කිරීම සඳහා වූ සැලසුම් පරික්ෂා කිරීම සහ ගාස්තු අයකිරීම පිළිබඳ වූ අතුරු ව්‍යවස්ථාවේ 12 වගන්තිය ප්‍රකාරව අඹතැන්න ප්‍රදේශයේ පිහිටි පැනරෝමා පාර්ක් ඉඩම හා හෙලන්ගේ වත්ත නමැති ඉඩමෙන් ප්‍රජා හා විනෝද කටයුතු සඳහා පර්චස් 123 ක බිම් ප්‍රමාණයක් සභාවට පවරාගෙන නොතිබුණු අතර 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 (1) වගන්තිය ප්‍රකාරව එම ඉඩම් වලින් සියයට 1 බදු අයකර ගෙනද නොතිබුණි. | පෙට් බෝතල් බහාලුමක් ඉදිකිරීමට කටයුතු කරන බව. | අදාළ ඉඩම් අරමුණුගත කාර්යයකට යොදවා ගත යුතුය. |

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.13,919,744 ක වාහන 03 ක් හා යන්ත්‍රෝපකරණයක් සහ වටිනාකම හඳුනාගත නොහැකි වාහනයක් වසර 03 ත් 07ත් අතර කාල පරාසයක සිට නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි. | අලුත්වැඩියාවන් කිරීමට හා වෙනත් සභාවකට පැවරීමට කටයුතු කරන බව. | අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට හා භාවිතයට ගත නොහැකි වත්කම් අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.4 වත්කම් කළමණාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාව පරිහරණය කරන ඉඩම් හා ගොඩනැගිලි 31 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර රු. 7,967,144 ක ගල්රෝලෙහි අයිතිය පවරාගැනීමට කටයුතු කර නොතිබුණි. | පවරා ගැනීමට කටයුතු කරන බව | වත්කම් පවරා ගත යුතුය. |

## 3.5 ව්‍යාපෘති, කතර්ව්‍යන් හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඉකුත් වර්ෂවල පුනරාවර්තන ආදායම් ප්‍රාදේශීය සංවර්ධනයට යොදවා ගැනීමකින් තොරව රු.37,450,000 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. | ස්ථාවර වත්කම් වැඩිදියුණු කිරීම සඳහා ආයෝජනය කර ඇති බව | ප්‍රාදේශීය සංවර්ධන කටයුතු සඳහා යොදා ගත යුතුය. |

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අනුමත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්යමණ්ඩලය සැසඳීමේදී තනතුරු 11 ක පුරප්පාඩු 20 ක් ද තනතුරු 1 ක අතිරික්තතා 11 ක් ද පැවතුණි. | රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම හේතුවෙන් පුරප්පාඩු පවතින අතර අතිරික්ත තනතුරු සංවර්ධන නිලධාරීන් බව. | කාර්යමණ්ඩලය අනුමත කරගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### තිරසර සංවධර්න අරමුණු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනතේ නියමයන්ට අනුව සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන තිබුණද ඒවා ලඟාකර ගෙන නොතිබුණි. | ඉලක්ක කරා ළඟා වීමට කටයුතු කරන බව. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |